**අකුරණ ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අකුරණ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම්ගත වීමකින් හෝ වෙනත් බැඳීමකින් තොරව යාලුගහවෙල කසළ අංගනයට විදුලිය ලබා ගැනීම සඳහා වෙන්කර තිබුණු රු.500,000 ක ප්‍රතිපාදන මුදල ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | වාචිකව විමසීම් සිදු කර ඇස්තමේන්තුවක් ලබා ගත් බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | යාලුගහවෙල කොම්පෝස්ට් අංගනය සංවර්ධන වියදම රු.4,758,298 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා වියදම ප්‍රාග්ධනිත කර ඇති බව. | වැය කිරීම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලැබිය යුතු රු.4,603,560 ක ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී පවතින හිඟය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ආදායම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.36,993,987 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 571(3) | 2009 සිට 2019 කාල පරිච්ඡේදයට අදාළව මිශ්‍ර තැන්පතු 07 ක් හා 2018 – 2020 කාල පරිච්ඡේදයට අදාළ කර්මාන්ත තැන්පත් 05 ක් ඇතුළු එකතුව රු.161,639 ක තැන්පතු 12 ක් නියාදනය කර නොතිබුණි. | ගෙවීම් සඳහා ඉල්ලීම් කර නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,683,350 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,400,644 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,626,800 | 86,671,101 | 8,632,142 | 3,545,301 | 7,626,800 | 7,912,202 | 6,271,769 | 3,506,342 |
| (ii) | කුලී | 6,383,839 | 6,794,574 | 6,910,641 | 320,368 | 5,763,839 | 4,851,949 | 3,227,019 | 436,435 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,855,000 | 4,180,200 | 4,180,200 | - | 3,630,000 | 4,141,450 | 3,445,900 | - |
| (iv) | වෙනත් ආදායම් | 34,057,500 | 68,030,719 | 60,709,758 | 27,286,976 | 69,763,400 | 75,108,357 | 17,811,077 | 19,996,015 |
| | | 51,923,139 | 87,676,594 | 80,432,741 | 31,152,645 | 86,784,039 | 92,013,958 | 30,755,765 | 23,938,792 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| i. | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.3,544,986 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 46 කින් එකතුව රු.805,215 ක වරිපනම් හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආදායම් රැස්කළ යුතුය. |
| ii. | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව 2022 වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | මේ වන විට තක්සේරු කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | වසර 05 කට වරක් තක්සේරු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.206,600 ක හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇති බව. | ආදායම් අයකළ යුතුය. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,830,689 ක් හා මුද්දර ගාස්තු රු.25,433,495 ක් විය. | උපලේඛන ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපි හා ලැබී ඇති උපලේඛන වලට අදාළ ආදායම අය කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කරන ලද රු.4,600,000 ක සංවර්ධන යෝජනා 24 ක් ඉටුකර නොතිබුණි. | අයවැයෙන් වෙන්කළ යෝජනා වෙනස් කර ව්‍යාපෘති ඉටුකළ බව. | අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යාලුගහවෙල කසළ අංගනයේ නොදිරන කසළ, දාහකය මඟින් දහනය කළද ඉන් ජනනය වන අළු අහිතකර ලෙස පරිසරයට නිදහස් කර තිබුණු අතර හලන යන්ත්‍රය කාබනික පොහොර නිෂ්පාදනයට යොදා නොගෙන නිෂ්කාර්යව රඳවා තිබුණි. | කසළ අංගනයේ වැඩ අවසන් කර හලන යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | යන්ත්‍ර උපයෝජනය කර කසළ කළමනාකරණයට යොදවාගත යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වෙනත් සභාවලින් අදාළ සේවාව ලබා ගන්නා බව. | පනතේ විධිවිධානවලට අනුගතව කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.36,667,265ක් වූ අතර, ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.3,887,680 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.3,545,815ක ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් අය කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.39,625,612 ක් වූ අතර ඉන් වසර 1 ත් 3 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.11,250,264 ක් හා වසර 3 ත් 5ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.695,056 ක් නිරවුල්කර ගෙන නොතිබුණි. | අදාළ මුදල් පියවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | සභාව පරිහරණය කරන යන්ත්‍රෝපකරණ 02 ක් හා ට්‍රැක්ටරයක අයිතිය පවරා ගෙන නොතිබුණු අතර, එම වාහන හා යන්ත්‍ර වලට අදාළ තොරතුරු කිසිවක් නඩත්තු කරද නොතිබුණි. | ඉදිරියේදී අයිතිය සම්බන්ධව හා තොරතුරු නොමැති වාහන හා යන්ත්‍ර සම්බන්ධව සොයා බලා කටයුතු කරන බව. | අයිතිය තහවුරු කරගත යුතුය. |
| (ඈ) | සභාව පරිහරණය කරන පන්සලතැන්න වත්ත සුසාන භූමිය පිහිටි ඉඩම හා විලාන උඩගම හපුගොල්ල වත්ත ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මැනුම් කටයුතු කර පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.17,649,179 ක මොටර් ග්‍රේඩරය වසර 06 ක කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | වෙනත් සභාවක් සමඟ හුවමාරු කිරීමට කටයුතු කරන බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 10 ක පුරප්පාඩු 24 ක් ද තනතුරු 02 ක අතිරික්තතා 20ක් ද පැවතුණි. | රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පුරප්පාඩු පවතින බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| ඉකුත් වර්ෂයේ ජනවාරි හා මාර්තු මාසවල ස්ථාන මාරුවී ගොස් තිබුණු නිලධාරීන් දෙදෙනෙකුගේ රු.383,272 ක ණය ශේෂයක් හා මිය ගොස් ඇති නිලධාරියෙකුගේ රු.6,645 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර ඇති බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 04 ක සියයට 10 සිට සියයට 163 දක්වාද, වියදම් විෂයයන් 05 ක සියයට 12 සිට සියයට 43 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් ආදායම් හා වියදම් ප්‍රශස්ථව ළඟාකර ගැනීමට නොහැකි වූ බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල කර ගත යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |